කෝරළේ පත්තු - බටහිර ප්‍රාදේශිය සභාව

මඩකලපුව දිස්ත්‍රික්කය

-----------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මැයි 30 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මැයි 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 04 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට කොරළේ පත්තු - බටහිර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

--------------------------------------------------------

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එෆ්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණයවිය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 16,000 ක්වූ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 1990 වසරේදී අස්ථානගතවූ ට්‍රැක්ටර් රථයක වටිනාකම වන රු. 681,000 ක මුදල පොත්වලින් කපා හැරීමට කටයුතුකර නොතිබුණි.

1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාලච්චෙනයි කඩදාසි කම්හලෙන් ලැබියයුතු වරිපනම් රු. 10,076,114 ක මුදල වසර දහයකට වඩා වැඩි කාලයක් හිඟව පැවැති නමුදු, එම මුදල මෙම වාර්තා දිනය දක්වා අයකරගෙන නොතිබුණි.

(ආ) සේවය හැර ගිය හා විශ්‍රාම ගිය සේවකයින් හතරදෙනකුට ලබා දී තිබූ ණය මුදලින් අයකර ගතයුතු රු. 96,026 ක මුදල විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු | |
| ඉඩම් හා ගොඩනැගිලි | 35,936,292 | හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 387,376 | ස්ථාවර වත්කම් ලේඛන, වත්කම් පිළිබද විස්තරාත්මක උපලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| මොටර් වාහන | 3,009,982 | |
| ලි බඩු සහ සවිකිරීම් | 713,484 | |
| පුස්තකාල පොත් | 1,202,649 | |

1.3.5 නීති, රීති රෙගුලාසි යනාදියට අනුකුල නොවීම

-----------------------------------------------

පහන සඳහන් අනුකුල නොවූ අවස්ථා විගණනයදී නිරීක්ෂණය විය.

| නීති රීති යනාදියට යොමුව | අනුකුල නොවීම |
|---|---|
| (අ) ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති-1988 | |
| (i) 1පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරින් හතර දෙනෙකුට ක්‍රමානුකුලව භාරදී තිබුණද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ii) III පරිච්ඡේදයේ 81 වගන්තිය | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තුව අවසානයෙදී ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) X පරිච්ඡේදයේ 191 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ මහා සභා රැස්වීම් දොලහක් පවත්වා තිබූ නමුදු, එම රැස්වීම් වාර්තාවල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. |
| (iv) X පරිච්ඡේදයේ 193 වගන්තිය | වර්ෂයට අදාල තථ්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධ විස්තර අයවැය ලේඛනය සමඟ සංසන්දනයකර විචලනය සඳහා පැහැදිලි කිරීම් ඇතුලත් වාර්තාවක් පිළියෙලකර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 4,949,089 ක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 2,010,863 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 6,959,952 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් කළමනාකරණය

-----------------------------

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

----------------------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයයේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය ආදායම | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වරිපනම් හා බදු | 1,100,000 | 203,670 | 896,330 | 81 |
| කඩ කුලී | 3,055,000 | 2,506,533 | 548,467 | 18 |
| බලපත්‍ර ගාස්තු | 1,575,000 | 1,428,636 | 146,364 | 09 |

2.2.2 වරිපනම් හා බදු

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134, 158 සහ 159 වගන්ති අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් හා ඉදිකරන ලද නිවාස හා ගොඩනැගිලි මත 1989 වර්ෂය සිට 2013 වර්ෂය අවසානය දක්වා වරිපනම් බදු ගණනයකර අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

ප්‍රාදේශිය සභාවට අයත් ගව ඝාතකාගාරය රු. 1,788,189 වියදමින් අළුත්වැඩියා කිරීම සඳහා ගිවිසුම් අත්සන්කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) BOQ ප්‍රමාණ පත්‍රය අනුව (විෂය 14) "Zinc aluminum and color coated roofing sheets" සෙවිලි තහඩු කොන්ත්‍රාත් කරුවන් විසින් යොදාගතයුතුව තිබුණි. කෙසේවුවද, 2014 ජුනි 30 දින පවත්වන ලද භෞතික පරීක්ෂණයේදී තුනී සෙවිලි තහඩු යොදාගෙන තිබු බවත් සෙවිලි තහඩු මල බැදී තිබු බවත් නිරීක්ෂණය විය. මේ හේතුවෙන් වර්ග අඩි 250 ක් සඳහා සවිකර තිබු සෙවිලි තහඩු කඩා වැටීමේ තත්වයක තිබූ බව නිරික්ෂණය වු අතර ඒ වෙනුවෙන් වැය කරන ලද රු. 545,668 ක මුදල නිෂ්ඵල වියදමක් බව අනාවරණය විය.

(ආ) රු. 103,498 ක් වැයකර වැසිකිළි ඉදිකර තිබු නමුදු, එයට අදාල වැසිකිළි වල (Toilet Pit) ඉදිකර නොතිබු හෙයින් විගණන පරීක්ෂණ අවස්ථාව වන විට වැසිකිළිය ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයක තිබුණි.

(ඇ) ගව ඝාතකාගාරයට විදුලිය සම්බන්ධතාවය සඳහා රු. 45,367 ක මුදලක් ප්‍රමාණ පත්‍රයේ (bill of quantity) ඇතුලත්වී තිබු නමුත් එය සම්පූර්ණ කර නොතිබුණි. මේ හේතුවෙන් ගව ඝාතකාගාරය රාත්‍රි කාලයේ ප්‍රයෝජනයට ගත නොහැකිවී තිබුණි.

(ඈ) ගව ඝාතකාගාරයට ජල සම්බන්ධතා ලබා ගැනීම සඳහා (Plumping work) රු. 51,127 ක මුදලක් ප්‍රමාණ පත්‍රයේ ඇතුලත් වී තිබුණද, අදාල කාර්යය සම්පූර්ණකර නොතිබුණි. මේ හේතුවෙන් අසල තිබෙන වැවේ අපිරිසිදු ජලය ගව ඝාතකාගාරයේ ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(ඉ) දොරවල් හතරක් සඳහා රු. 33,640 ක ඇස්තමෙන්තු කර තිබු නමුත් එක් දොරක් පමණක් ගව ඝාතකාගාරයට සවිකර තිබුණි.

3.2 නිෂ්ක්‍රිය වත්කම්

------------------

ඝණ අප ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා යොදාගන්නා ලද ට්‍රැක්ටර් රථ දෙකක් අළුත්වැඩියා කිරීමකින් තොරව වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් නිෂ්ක්‍රියව තිබූ බව නිරීක්ෂණය විය.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

----------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තියේ දක්වා ඇති නමුත් සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය

------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 45 % සිට 92 % දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් කළමනාකරණය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) අයවැය පාලනය